# රත්තරන් බණ පොතෙන් හමුවූ අවලෝකිතේශ්වර පුරාණය

**අවලෝකිතේශ්වර බෝධිසත්වයාණන් පිළිබඳ සමාජයෙහි නැවත උනන්දුවක් ඇතිවී තිබේ. එයට මුල්වූ සිදුවීම අප්‍රසන්න එකක් වුවද එයින් ඇතිවූ සංවාදය අවලෝකිතේශ්වර සංකල්පය පිළිබඳ සාධනීය කරුණු රැසක් අනාවරණය කිරීමට මුල් විය.**

අවලෝකිතේශ්වර බෝධිසත්වයන් පිළිබඳ ලිඛිත මූලාශ්‍රයක රනින් කළ අකුරුවලින් කියවන්නට ලැබීම ඉතිහාසයේ අමරණීය අත්දැකීමකි.

දිනය 1982 දෙසැම්බර් 18 ද ය. ස්ථානය අනුරපුර පිහිටි ගඩොලින් කළ ලොව විශාලතම ස්තූපය වන ජේතවනය අසල පුරාවිද්‍යා කැණීම් භූමියයි.

අසිරිමත් දසුනකි. රත්තරන් බණ පොතක් එතැනින් මතුවිය.

මෙහි දිග අඟල් විසිපහ (25) කි. පළල අඟල් 2.3කි. මෙම පුරාවිද්‍යා කැණීමේදී රත්රන් පත් ඉරු හතක් හමුවිය. බර අවුන්ස 73කි. කම්කරුවන් දෙදෙනකු විසින් මෙම කැණීම් වළේ කැණීම් කරන අවස්ථාවේදී වළං කැබලි කීපයක් ද සමග කහපාට ලෝහමය ද්‍රව්‍ය කැබැල්ලක්ද දැක ඇත. මෙම කැණීමෙන් වළඳක දමා තිබුණු රන්පත් හතම සේප්පුවක දමා ආරක්ෂාව සඳහා පුරාවිද්‍යා බලධාරීහු කටයුතු කළහ.

## අඩංගු කරුණු හා ඉතිහාසය

මෙම රන්පත් ඉරුවල සඳහන් වන්නේ මහායාන සූත්‍රයක් වූ ප්‍රඥාපාරමිතා සූත්‍රයේ කොටස්ය. එය බුදුරජාණන් වහන්සේ සිය ශ්‍රාවකයන් සමග කරනු ලබන ධර්ම සංවාදයක ස්වරූපයෙන් සකස් වූවකි.

මහායාන බෞද්ධ ධර්මයෙහි ප්‍රඥාපාරමිතාව සූත්‍රය යනුවෙන් ශූන්‍යතා ධර්මය මෙන්ම බුදුරජාණන් වහන්සේගේ ධර්මකාය ගැනද හැඳින්වේ. එසේම ප්‍රඥාපාරමිතා සූත්‍රයේ පෙළ ද විමුක්තිය සඳහා වූ මාර්යද එයින් අදහස් කරනු ලැබේ.

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී ලංකාවට බුදු දහම මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේවානම් පියතිස්ස රාජ යුගයේදී හඳුන්වා දුන් කාලයේ සිටම ක්‍රිස්තු වර්ෂ දෙවැනි සියවසේ මහායාන ධර්මය ව්‍යාප්තිය ඇතිවන තුරුම ථේරවාදී බුදු දහම පැවතුණ බව ඉතා ප්‍රකට කරුණකි. අද පවා මේ රටේ ථේරවාදී බුදු සමය පවතින බව ඉතා ප්‍රකටය. මහායාන බුදු සමයේ ද අවසාන පරමාර්ථය වනුයේ උත්තරීතර බුද්ධත්වයට පත්වීමයි. එය ථේරවාදයෙහි උත්තරීතර බුද්ධත්වයට පත්වීමයි. එය ථේරවාදයෙහි සඳහන් වන බුදු පසේ බුදු මහරහත් යන තුන්තරා බෝධියට වඩා මදක් වෙනස් වූ දර්ශනයකි.

බෝධිසත්ව දර්ශනය මහායානයෙහි ඉතා වැදගත් තැනක් ගන්නා අතර එම තත්ත්වයට පත්වීම සඳහා ප්‍රධාන වශයෙන් දාන පාරමිතාවෙන් ආරම්භ වී ප්‍රඥා පාරමිතාවෙන් අවසන් වන පාරමිතා හයක් පිරිය යුතුය. ථේරවාදී බුදු දහමෙහි සඳහන් වන පාරමිතා ගණන දසයකි. ප්‍රඥා පාරමිතාව පිරීම ප්‍රඥා පාරමිතා සූත්‍රයෙහි දක්වා ඇති පරිදි ප්‍රධාන ස්ථානයක් ගනී. ප්‍රඥා පාරමිතා සූත්‍ර කිහිපයක්ම තිබෙන අතර මෙම රන්පත් ඉරුවල ඉන් එක සූත්‍රයක කොටස් ලියා ඇත.



ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා සහ අගමැති ආර්. ප්‍රේමදාස මහතා රත්රන් බණ පොත ජනාධිපති මන්දිරයේදී පරීක්ෂා කර බැලූ අවස්ථාව.

## රන් පත්වල ලියා ඇති අකුරු

රන් පත්වල ලියා ඇති අකුරු ක්‍රිස්තු වර්ෂ 9 වන සියවසට අයත් පැරණි සිංහල අකුරු වේ. භාෂාව සංස්කෘතය. මෙම රන්පත්වල සඳහන් සූත්‍රය අසම්පූර්ණ ය. එයට හේතුව අතරින් පතර සමහර පත්ඉරු අඩුවී තිබීම ය.

**(ජේතවනාරාම රන් බණ පොත - ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවිද්‍යා කොමසාරිස් හා ආචාර්ය හේම රත්නායක, ජේතවන ව්‍යාපෘති අධ්‍යක්ෂ යුනෙස්කෝ - ශ්‍රී ලංකා ත්‍රිකෝණ ජේතවනාරාම ව්‍යාපෘතිය පි. 2 (1982))**

## ජේතවනාරාම රන් බණ පොතේ අඩංගු ධර්ම කොටස්

මෙම රන්පත් ඉරු හතේ (7) ප්‍රඥා පාරමිතාව විස්තර කෙරෙන මහායාන සූත්‍රයක කොටස් අඩංගුය.

සූත්‍රය ආරම්භ වන්නේ නිදාන කතාවෙනි. එය බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වැඩ වසන සමයෙහි ගිජ්ඣකූළ පව්වේදී අනන්තාපරිමාණ රහතන් වහන්සේලා ප්‍රමුඛ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිස සමග වැඩ සිටිමින් දේශනා කරන ලදහ. මංජු ශ්‍රී මහාස්ථාමප්‍රාප්ත යන මෛත්‍රිය ප්‍රමුඛ බෝධි සත්වවරුන් රාශියක්ද එම පිරිස අතර වූහ.

තථාගතයන් වහන්සේට නමස්කාර කිරීම හේතුකොට ගෙන සියලු සත්වයන්ගේ දුක දුරුවන අයුරින් එම පූජාව හේතුකොට ගෙන ''ජාත්‍යන්ධ ජාතිබධිරාදීන්'' පවා අංග සම්පූර්ණ සත්වයන් වන අයුරුත් එහි සඳහන්ය.

නානාවිධ මාලා ගන්ධ විලේපනාදිය දස දහස් සංඛ්‍යාත දේව බ්‍රහ්ම මනුෂ්‍යාදී සියලු සත්වයන් බුදුරජාණන් වහන්සේ පුද දේශනාවලට සවන්දුන් ආකාරය මෙන්ම ප්‍රඥාපාරමිතාව දේශනා කරන භාග්‍යවතුන් වහන්සේට වන්දනාමාන කොට එය ශ්‍රවණය කිරීමට පැමිණි බෝධිසත්වවරුන් නම් වශයෙන් සඳහන් කර ඇත.

තවද අසංඛ්‍ය කල්පයකට පසු ශාරිපුත්‍රයන් වහන්සේ නා නා පාරමිතාවන් සම්පූර්ණ කොට බුද්ධත්වයට පත්වන බවද සඳහන්ය. පාරිමිතා පූර්ණය සහ කුසලක්‍රියා හේතුකොට ගෙන අත්වන ඵල ප්‍රයෝජන දක්වා ඇති අතර ප්‍රඥාපාරමිතාව පිරීමෙන් දිව්‍යඥානය සහ සත්‍යාවබෝධය ලැබෙන බවද සඳහන් කර ඇත.


තවද අසංඛ්‍ය කල්පයකට පසු සාරිපුත්‍රයන් වහන්සේ නානා පාරමිතාවන් සම්පූර්ණ කොට බුද්ධත්වයට පත්වන බවද සඳහන්ය.

පාරමිතා පූරණය සහ කුසල ක්‍රියා හේතුකොට ගෙන අත්වන ඵල ප්‍රයෝජන දක්වා ඇති අතර, ප්‍රඥා පාරමිතාව පිරීමෙන් දිව්‍යඥානය සහ සත්‍යාවබෝධය ලැබෙන බවද සඳහන් කර ඇත.

කුසල් කිරීමෙන් ස්වර්ණ සම්පත්ද අකුසල්හි යෙදීමෙන් නිරය ප්‍රතිසන්ධිද ලැබෙන බව සවිස්තරව දක්වා ඇත.

අනන්තාපරිමාණ බුද්ධ ක්ෂේත්‍රයන් බුදුරජාණන් වහන්සේ විසින් සිය විඥානයන්ගෙන් ආවර්ජනය කරන අයුරු ද විස්තර කර ඇති අතර ෂඩ් පාරමිතා ද දක්වා සියලු ලෞකික ලෝකෝත්තර සම්පත් අත්කර දීමේ සමත් ප්‍රඥා පාරමිතාව විශේෂයෙන් සඳහන් කර ඇත.

දානශීලාදී අනෙකුත් පංච පාරමිතා පූරන අතරම ප්‍රඥා පාරමිතාව පිරිය හැකි බව ද සඳහන්ය.



රන්පත් ඉරු



රන්පොත ජේතවනාරාමය අබියසින් මතුවූ මොහොතේම අනුරාධපුර පුරාවිද්‍යා සහකාර කොමසාරිස් පී.එම්. රත්නායක මහතා සහ එම වැඩබිමේ ප්‍රධාන පරීක්ෂක සරත් වත්තල මහතා එහි ගොස් පරීක්ෂාකර බලති. රන්පොත සොයාගත් කේ.පී. සෝමපාල මහතා සහ බී.පී. පද්මාවතී මහත්මියද උප පොලිස් පරීක්ෂක ලයනල් කුලතුංග මහතාද මෙහි සිටිති.



ජේතවන ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ හේම රත්නායක මහතා ලේඛන ගත කිරීම සඳහා රන්පත් ඉරුවල ඝනකම පරීක්ෂා කරයි. ව්‍යාපෘති කළමනාකාර පියල් පණපිටිය මහතාද මෙහි වෙයි.

අවසාන වශයෙන් බුදුරජාණන් වහන්සේ හා සුභූති තෙරුන් අතර ධර්ම සංවාදය සවිස්තරාත්මකව සඳහන් කර නොයෙක් ආකාරයෙන් ප්‍රඥා පාරමිතාව පිරීමේ ආනිශංස දක්වමින් සියලු ධර්මයන් ශූන්‍යයයි අවබෝධ කටයුතු බවද දේශිතය.

**(ජේතවනාරාම රන් බණපොත - පි. 6, මහාචාර්ය ලීලානන්ද ප්‍රේමතිලක - ශ්‍රී ලංකාවේ ලෝකඩ මූර්ති කලා උරුමය පි. 69-1995)**

## රන්පොත ගැන

මෙහි ස්වභාවය අනුව මුල් අවස්ථාවේදී එයට පත්ඉරු තිස් පහ (35) වැනි සංඛ්‍යාවක් තිබෙන්නට ඇත. අක්ෂර විද්‍යානුකූලව මෙම රන්පත් ඉරු ලේඛනය ක්‍රිස්තු වර්ෂයෙන් නව වන සියවසට අයත් කළ හැකිය. මේ යුගයට අයත් බෝධිසත්ව ප්‍රතිමා රාශියක් දැනට සොයා ගෙන ඇති බැවින් එම වකවානුව තුළ මහායාන බුදු දහම ශ්‍රී ලංකාවේ පැතිරී තිබූ ආකාරය එයින් මැනවින් පැහැදිලි වේ. ඇතැම් විටෙක ක්‍රිස්තු වර්ෂයෙන් හය වන සියවසේ මැද භාගයේදී ශ්‍රී ලංකාවට ගෙන එන ලද පුස්කොළ ලේඛනයට අනුව සකස් කරන ලද පිටපතක් සේ මෙම රන්පත් ඉරු ලේඛනය පැහැදිලිව හඳුනාගත හැකිවේ. ජේතවනාරාම පුදබිමේ පුරාවිද්‍යා කැණීමෙන් ලබාගන්නා ලද මෙම රන්පත් ඉරු පුස්කොළයක සත්‍ය ආකෘතියක් සේ නිමවා තිබේ.

මෙහි දැක්වෙන සියල්ල පංචවිංසති සහශ්‍රිකා පාරමිතා සූත්‍රය ලෙස හඳුනාගෙන ඇත. එය ක්‍රි.ව. දෙවැනි සියවසේදී ඉන්දියාවේ රචිත ප්‍රචලිත සූත්‍රයකි. මෙම වටිනා ලියැවිල්ල කියවනවාට වඩා පූජාවට ලක් කෙරෙන්නට ඇත. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වල සාරය ලෙස සලකා මෙවැනි ලේඛන අදත් ශ්‍රී ලංකාව තුළ මෙන්ම වෙනත් තැන්වල ද වන්දනාවට ලක් වෙයි. බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේට ලැබෙන වැදගත්කමට සමාන පූජනීයත්වයක් මෙයට ද ලැබේ.

**(ශ්‍රී ලංකාවේ ලෝකඩ උරුමය - මහාචාර්ය පී. එල්. ප්‍රේමතිලක පි. 69 )**

## මහායාන රන්පත් ඉරු

මෙම පත් ඉරුවල අඩංගු වන්නේ මහායාන බුද්ධාගමේ ඉතාම පූජනීයත්වයට පත් ප්‍රඥා පාරමිතා සූත්‍රයට අයත් සූත්‍රයේ කොටසකි. එම රන්පත් ඉරු හයක දෙපැත්තේද එක් පත් ඉරුවක එක පැත්තකද වශයෙන් ලියූ පිටු 13 වේ. එක් පිටුවක පේළි නවයකි. පිළිවෙළින් 1 සිට 13 තෙක් සූත්‍රය ලියා ඇතත් දෙවැනි පිටුව නැත.

**23 වැනි පිටුවට...**

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ**

**■ සිරිසමන් විජේතුංග**

# රත්තරන් බණ පොතෙන් හමුවූ අවලෝකිතේශ්වර පුරාණය...

**20 වැනි පිටුවෙන්**

**ප්‍රඥා පාරමිතාව යනු සද්ධර්ම පුණ්ඩරීක ලලිත විස්තර ලංකාවතාර සූත්‍රය වැනි මහායාන බුද්ධාගමේ අතිපූජනීයත්වයට පත් සූත්‍ර අතරින් එකක් වන අතර, ජේතවන විහාර භූමියෙන් හමුවී ඇත්තේ ප්‍රඥා පාරමිතාවේ පංච විංසති සහශ්‍රිකා ප්‍රඥා පාරමිතා සූත්‍රයයි. සහශ්‍රිකා ප්‍රඥා පාරමිතාව මහායාන බුද්ධාගමේ පූජනීයත්වයට පත් ධර්ම පර්යාය නමින් හැඳින්වූ සූත්‍රවලින් එකකි.**

මෙය සංස්කෘති භාෂාවෙන් ලියන ලද ක්‍රිස්තු වර්ෂ 9-10 සියවස් වලට අයත් සිංහල අක්ෂරවලින් ලියා ඇත. මුල් සංස්කෘත පිටපත අස්ථාන ගතවී ඇතත් ටිබෙටයේ සහ චීනයේ එහි අසම්පූර්ණ පිටපත් වේ. එහි පත් ඉරු 137 ඇති බව කියැවේ. මහා වංසයේ සඳහන් පරිදි සිලා කාල රජුගේ කාලයේදී කසීරට සිට පැමිණි වෙළෙන්ද ගෙන එනු ලැබූ ධර්මධාතුව මෙම ප්‍රඥා පාරමිතාව බව සමහරු කියති. එම වෙළෙන්ද ගෙන ආවේ වෛතුල්‍ය ධර්මය බව නිකාය සංග්‍රහය සඳහන් කරයි.

මහායාන සූත්‍ර ස්තූපවල නිදන් කිරීම පිළිබඳ සාක්ෂි මීට පෙර හමුවී ඇත. නිදසුනක් වශයෙන් මිහින්තලේ ඉඳිකටු සෑයේ නිදන්කොට තිබූ ක්‍රි.ව. 8 හා 9 සියවස්වලට අයත් අතුරින් තඹපත් ඉරු මත ලියන ලද ප්‍රඥා පාරමිතාවේ කුඩා කොටස් හමුවී ඇති බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරයි. එහෙත් ජේතවනාරාම රන්පත් ඉරු හමුවූයේ මැටි භාජනයක බහා විහාර දගැබේ භූමියේ වළලා තිබියදීය. එහෙයින් මෙය ප්‍රඥා පාරමිතාව සම්පූර්ණයෙන්ම ලිවීමට සූදානම් කළ අවස්ථාවක විශේෂයෙන් අනුරාධපුර අවසාන කාලයේ ඇතිවූ සොළී ආක්‍රමණයේදී ආරක්ෂාව සඳහා සඟවා තැබීමක් යැයි දැනට අනුමාන කරනු ලැබේ. මෙම රන්පත් ඉරු දැනට ලංකාවෙන් හමුවී ඇති දීර්ඝතම සංස්කෘත අභිලේඛනයයි.

**(අනුරාධපුර ජේතවන විහාරය මහායාන රන්පත් ඉරු මහාචාර්ය ටී. ජී. කුලතුංග පි. 57-59-2001)**

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා ලංකාවේ බෝධිසත්ව සංකල්පය පිළිබඳ ග්‍රන්ථයේ මෙසේ සඳහන් කරයි.

පළමුව ඉන්දියානු ධර්ම දූතයන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් මානුෂික බෝධිසත්ව සංකල්පය හා එම බෝධිසත්ව වන්දනාවයි. මෛත්‍රය බෝධිසත්වයන්ට එහි විශේෂ තැනක් හිමිවිය. එසේ වූයේ මීළඟට බුදුවන්නට සිටින්නේ ඒ බෝධිසත්වයන් වීමත් සිංහල බෞද්ධයන් මෛත්‍රය බුදුන් දැක නිවන් දැකීමට අපේක්ෂාවෙන් සිටීමත් නිසාය. දෙවැනිව මහායානිකයෝ ක්‍රි.ව. 3 වන සියවස සමයේදී ශ්‍රී ලංකාවට ඔවුන්ගේ බෝධි සත්වයන් හඳුන්වා දුන්හ. ඔවුන්ගේ මෛත්‍රෙය හැර අනෙක් හත් දෙනාම ධ්‍යානි බෝධිසත්වයෝය. දැනට ක්‍රියාත්මක අවලෝකිතේශ්වර හෙවත් නාථ ඔවුන් අතර මුල්තැන ගනී. එම බෝධිසත්වයෝ මහා කරුණාව නියෝජනය කරමින් අතට පත් නිවන් සුව හැර පියා දුකට පත් සත්වයන් බුද්ධත්වය කරා යොමු කිරීම හා ඔවුන් ආරක්ෂා කිරීම තම වගකීම බව සඳ ක්‍රියා කරන්නෙක් වෙති. රෝග සුවකිරීමට ඔහුට ඇති අතිමානුෂික බලය අනභිභවනය බෝධිසත්වවරයකු වශයෙන් මතුවීමට හේතුවිය.

තුන්වෙනිව මහා විහාරිකයෝ මහායාන බෝධිසත්ව සංකල්පය දියුණු කළහ. එසේ වුවද අවලෝකිතේස්වරට ඉහළින් මතුවීමට එකද මහායාන බෝධිසත්වයකුට වත් නොහැකි වූ බව පෙනේ.

සිව්වැනිව එක්තරා කාලයක් මෛත්‍රෙය හා අවලෝකිතේශ්වර සම තත්ත්වයෙන් සැලකීමට සිංහල බෞද්ධයෝ පුරුදුව සිටියහ. ඒ තත්ත්වය වැඩිකල් රඳවාගත නොහැකි විය. අවලෝකිතේශ්වර මුළු සිංහල බෞද්ධ ජනතාවගේම බලවත් වූ බෝධිසත්වවරයා බවට පත්විය. නුවර යුගය (18 වැනි සියවස) වන විට 'පත්ලෙව්හට බුදුන්' යන විශේෂණයෙන් ඔහු හඳුන්වනු ලැබූහ. මීට කලින් 15 වැනි සියවසේදී පමණ ඔහුගේ අලුත් අවතාර අටක් හඳුන්වා දී තිබේ. ඒ අටට අයත් වන්නෝ හින්දු දෙවිවරු හා දේවතාවියෝය. එමගින් හින්දූන් අතර ද අවලෝකිතේශ්වරගේ බලපෑමක් ඇතිකිරීමට උත්සාහ දරා තිබේ. හින්දූන් අතර කෙසේ වෙතත් සිංහල බෞද්ධයන් අතර එම අවතාරවලට ද තැනක් ලැබිණ. අවලෝකිතේශ්වර දේශීයකරණයට ගන්නා ලද උත්සාහයක් මෙහිදී දැකිය හැකිය. අවසාන වශයෙන් මහනුවර යුගයටත් කලින් මෛත්‍රෙය ද අවලෝකිතේශ්වර ස්වරූපයක් ගනී.

**(ශ්‍රී ලංකාවේ බෝධිසත්ව සංකල්පය - මහාචාර්ය චන්ද්‍රා වික්‍රම ගමගේ පි. 52-1996 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව)**